# උඩපලාත ප්‍රාදේශීය සභාව

# 2022.09.14 දින ටෙන්ඩර් මණ්ඩල වාර්තාව

- **තීරණ අංක 01**

සභාවේ නව මාර්ග කම්කරුවන් සඳහා අවශ්‍ය වැසි කබා මිලදී ගැනීමට මිල ගණන් කැඳවීය. ඒ සඳහා ලද මිල ගණන් පහත පරිදි වේ.

| අනු අං: | විස්තරය | මහනුවර ඒජන්සි | උපුල් හාඩ්වෙයාර් | රීගල් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| 01 | වැසි කබා (උඩ යට වෙන්ව ඇති) | 2250.00<br>(ශ්‍රී ලංකා) | 4700.00 (Rainco)<br>2500.00 (Normal) | 3450.00 |

මෙම මිල ගණන් අනුව අවම මිල යටතේ මහනුවර ඒජන්සිස් ආයතනයෙන් 01ක් රු.2550.00 ට මිලට ගැනීම සුදුසු නමුත්, මිලදී ගැනීමට පෙර ගුණාත්මකභාවය පරීක්ෂා කර බැලිය යුතු බවත්, එම වැහි කබා නොගැලපේනම් අනෙක් ආයතනවල සහ ප්‍රදේශයේ ආයතනවලින් ද පරීක්ෂා කොට බලා මිල ගණන් ලබාගෙන මිලදීගැනීම් කළ යුතු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 02**

සභාවේ සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරුවන් සඳහා අවශ්‍ය බොටම් සහ ටී ෂර්ට් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීය. ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ට අමතරව ප්‍රදේශයේ සැපයුම්කරුවන්ගෙන්ද මිල කැඳවීය.

| අනු අං: | විස්තරය | CIB | බන්දුල ටේලර්ස් | නිව් සමනල ටේලර්ස් |
|---|---|---|---|---|
| 01 | බොටම් කලිසමක්<br>ටී ෂර්ට් එකක් | 1350.00<br>2300.00 | 1560.00<br>2650.00 | 1675.00<br>2825.00 |

එම මිල ගණන් අනුව, අවම මිල යටතේ CIB ෂොපින් සෙන්ටර් ආයතනයෙන් බොටම් 01ක් රු.1350.00 ටත්, ටී ෂර්ට් 01ක් රු.2300.00 ටත් මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි. පෙර වර්ෂයේදී ද මෙම නිල ඇඳුම් **CIB** ආයතනයෙන් මිලදී ගත් අතර ඒවා ඉතා හොඳ තත්වයේ පවතින බැවින් මෙම ආයතනයෙන් නිල ඇඳුම් මිලට ගැනීම වඩාත් යෝග්‍ය බවට තවදුරටත් ටෙන්ඩර් මණ්ඩලය තහවුරු කරන ලදි.

- **තීරණ අංක 03**

LL-7586 දරණ කෲ කැබ් රථයට බැටරියක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීය. සභාවේ ලියාපදිංචිකරුවන්ට අමතරව ප්‍රාදේශීය මිල ගණන් ද කැඳවූයේ භාණ්ඩ නොමැතිකම හේතුවෙනි.

| අ අං | විස්තරය | MJR පීරිස් & සන්ස් | Sisira Motors |
|---|---|---|---|
| 01 | 12 V - 120 Amp<br>Exide බැටරිය (LL 7586) | 72359.99 | (120 AMP) 72500.00<br>(150 AMP) 89500.00 |

මේ සඳහා කැඳවූ මිල ගණන් අනුව ඉන්ද්‍රා ට්‍රේඩර්ස්හි තොග නැති බවට whatsapp පණිවුඩයක් මගින් 2002.09.12 දින දන්වා එවන ලදි. ඒ අනුව, මේ සම්බන්ධව එවා තිබූ අනෙක් මිල ගණන් පරීක්ෂා කර බැලීමේදී අවම මිල ගණනක් MJR පීරිස් සමාගමෙන් ලබා දී තිබෙන මුත් ප්‍රවාහන වියදම සමග තීරණය කිරීමේදී ගම්පොල පිහිටි සිසිර මෝටර්ස් ආයතනයෙන් ම ඉහත බැටරිය මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලය

තීරණය කරන ලදි. එනම් Exide බැටරි 01ක් රු.72500.00 කට සිසිර මෝටර්ස් ආයතනයෙන් මිලදී ගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය තීරණයයි.

- **තීරණ අංක 04**

43-3382 දරණ ලොරි රථයට අවශ්‍ය සයිලන්සරයක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවන ලදි. ලැබී තිබුයේ එක් මිල ගණනකි.

| අ අං | විස්තරය | මීවතුර මෝටර්ස් |
|---|---|---|
| 01 | සයිලන්සරය (ISUZU) (43-3382) | 42600.00 |

මේ අනුව, සයිලන්සර් මිල ගණන් කැඳවීමෙන් මිලදී ගැනීමට ඇති අවස්ථා විරල වන බවත්, එය අවශ්‍ය කොටසු යොදා (ගරාජ් එකකට යොමු කොට) අලුත්වැඩියා කිරීමක් ලෙස සිදු කළ යුතු බවට ටෙන්ඩර් මණ්ඩලයේ අදහස විය. එබැවින්, මෙම මිල ගණන හා විස්තර මහ සභාවට ඉදිරිපත් කර අලුත්වැඩියා කිරීමක් බවට තහවුරු කර හෝ අදහස් ලබා ගෙන ඉදිරි කටයුතු 43-3382 ලොරි රථය සම්බන්ධයෙන් සිදු කළ යුතු බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය විය.

- **තීරණ අංක 05**

ගබඩාව සඳහා අවශ්‍ය ප්‍රා.ස.03 ලේඛනය මුද්‍රණය කර ගැනීමට මිල ගණන් කැඳවන ලදි. ඒ සඳහා ලද මිල ගණන් පහත දැක්වේ. ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීමට සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන ලදි.

| අ අං | විස්තරය | තිළිණ ප්‍රින්ටර්ස් |
|---|---|---|
| 01 | ප්‍රා.ස.03 ලේඛනය | 1300.00 |

ලද මිල ගණන් අනුව, තිළිණ ප්‍රින්ටර්ස් ආයතනයෙන් ප්‍රා.ස.03 පොතක් රු. 1300.00 බැගින් මුද්‍රණය කරවා ගැනීම සුදුසු බවටත්, මෙම පොත් ඇතුලු මුද්‍රණ කටයුතු බොහොමයක් සිදු කරනු ලබන්නේ තිළිණ ප්‍රින්ටර්ස් ආයතනයෙන් වන බැවින් මුද්‍රණ කටයුතු සම්බන්ධ මනා පළපුරුද්දක් ඇති බැවින් මෙම පොත්ද මුද්‍රණය කරවා ගැනීම යෝග්‍ය බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 06**

PB-7657 දරණ කෲ කැබ් රථයට ටයර් මිලදී ගැනීමට අවශ්‍ය මිල ගණන් කැඳවන ලදි. ඒ සඳහා ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අං | විස්තරය | MJR පීරිස් & සන්ස් | පෙරේරා ටයර් | STC |
|---|---|---|---|---|
| 01 | 700* 15 ටයර් (CEAT) (PB-7657) | (10PR) 41768.00<br>(12PR) 43608.00 | (10PR) 41785.00)<br>(12PR) 43630.00 | (10PR) 52670.00<br>(12PR) 55361.00 |

මෙම මිල ගණන් අනුව රථයට විශාල බරක් පැටවීමක් සිදු නොවන බැවින් (10PR) වර්ගයේ ටයර් අවම මිලට එනම් 01ක් රු. 41768.00 බැගින් MJR පීරිස් ආයතනයෙන් මිලදී ගැනීම ඉතා සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 07**

ග්‍රෝව්හිල් පුස්තකාලයට අවශය මග පෙන්වීම් පුවරු සකස් කර ගැනීමට මිල ගණන් කැඳවිය.

| අ අං | විස්තරය | තිළිණ ප්‍රින්ටර්ස් |
|---|---|---|
| 01 | අඩි 02ක් දිග අඩි 1ක් පළල GI තහඩුවක් මත උස GI බට භාගයක පමණ | 8500.00 |

මේ සඳහා වෙනත් ආයතන මිල ගණන් නොලද අතර තිළිණ ප්‍රින්ටර්ස් ආයතනයේ මිල ගණන සලකා බැලීමේදී, එම ගණන් සාධාරණ වීම මත හා මේ මුද්‍රණාලය මුද්‍රණ කටයුතු සඳහා මනා පළපුරුද්දක් ඇති බැවින්ද, තිළිණ ප්‍රින්ටර්ස් ආයතනයෙන් පුවරු 01 ක් රු. 8500.00 බැගින් සකසා ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 08**

තක්සේරු කණ්ඩායම සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට අවශ්‍ය මිල ගණන් කැඳවනු ලැබීය. තැපැල් කිරීමේදී ප්‍රමාද විය හැකි බැවින් මිල ගණන් Whatsapp කර තිබිණි.

| අනු අං | විස්තරය | පේපර්ලයින් ට්‍රේඩින් | නිව් ජෙනරල් | L.H.චන්ද්‍රසේකර |
|---|---|---|---|---|
| 01 | Box Files 3 | (Rexon) 661.25 | 530.00 | (Panther) 556.00 |
| 02 | Hard Cover (A4 Size) | 316.25 | 345.00 | ----- |

මේ සඳහා මිල ගණන් වට්ස්ඇප් පණිවුඩ මගින් එවා තිබූ අතර එම මිල ගණන් අනුව, අවම මිල ගණන් යටතේ Box File 01ක් රු.530.00 ට නිව් ජෙනරල් ආයතනයෙන් මිලදී ගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි. තවද, Hard Cover (A4 Size) සඳහා මිල ගණන් කැඳවූ නමුත්, ඉතා හදිසි කටයුත්තක් වූ බැවින් එම අයිතමයන් ටෙන්ඩර් කොට මිලට ගැනීමට තරම් කාලය ප්‍රමාණවත් නොවූ බව ටෙන්ඩර් මණ්ඩලයට දන්වා සිටියේ ය.

- **තීරණ අංක 09**

දොළුව පුස්තකාලයට අවශ්‍ය ග්‍රන්ථ සකස් කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීමට පුස්තකාල සේවා මණ්ඩලයේ මිල විමසීය. ඒ අනුව, පහත මිල ගණන් ලබා දී තිබුණි.

| අනු අං | විස්තරය | පුස්තකාල සේවා මණ්ඩලය |
|---|---|---|
| 01 | BOOK CARD (පොත් තුණ්ඩු) | 1.20 (1200.00) |
| 02 | BOOK POCKET (පොත් සාක්කු) | 4.98 (4980.00) |
| 03 | දින ලේබල් (සිංහල) | 1.08 (1080.00) |

ඒ අනුව, ග්‍රන්ථ සකස් කිරීමේ ද්‍රව්‍ය පුස්තකාල සේවා මණ්ඩලයෙන් මිලදී ගැනීම සුදුසු බැවින් BOOK CARD 01ක් රු. 1.20 ට ත්, BOOK POCKET 01ක් රු. 4.98 ටත්, දින ලේබල් (සිංහල) 01ක් රු. 1.08 බැගින් ද පුස්තකාල සේවා මණ්ඩලයෙන් මිලදී ගැනීම යෝග්‍ය බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 10**

පුස්සැල්ලාව ආදාහනාගාරයට අවශ්‍ය ගෑස් ලබා ගැනීමට වෙළඳපොළ පවතින ගැටලුකාරී තත්වය හේතුවෙන් නැවත ගෑස් සපයන්නන්ගෙන් අත්මිල ගණන් ලබා ගැනුණි. (ගෑස් අර්බුදය නිසා තාවකාලිකව ආදාහනාගාර කටයුතු නවතා ඇත)

| අනු අං | විස්තරය | ARTHY Gas Point | CHAMIDU Company |
|---|---|---|---|
| 01 | පුස්සැල්ලාව ආදාහනාගාරයට අවශ්‍ය ගෑස් ලබා ගැනීම - 37.5kg | 18361.00 | 19210.00 |

ලද අත් මිල ගණන් අනුව, අවම මිල හේතුවෙන් ද, පුස්සැල්ලාව ප්‍රදේශය තුළම පිහිටි බැවින් ප්‍රවාහනය පහසු නිසාද, ආරති ගෑස් පොයින්ට් ආයතනයෙන් ගෑස් මිලට ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය. ඒ අනුව, 37.5kg ගෑස් සිලින්ඩරයක් රු. 18361.00 ක අවම මිලට ආරති ගෑස් ආයතනයෙන් මිලදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- **තීරණ අංක 11**

සභාව සතු ඉඩම් මැනුම් කටයුතු සඳහා අවශ්‍ය වන කොන්ක්‍රීට් කණු (මායිම් සළකුණු කරන කණු) මිලදී ගැනීමට අත් මිල ගණන් කැඳවනු ලැබූයේ සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැති බැවිනි.

| අනු අං | විස්තරය | සම්පත් හාඩ්වෙයාර් | බාස්රොක් එන්ටර්ප්‍රයිසස් |
|---|---|---|---|
| 01 | කොන්ක්‍රීට් කණු (මායිම් සළකුණු කිරීමට යොදා ගන්නා) | 1600.00<br>( අඩි 6 උස ) | 900.00<br>( අඩි 4 උස ) |

ප්‍රදේශයේ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන සැපයුම්කරුවන්ගෙන් ලබා ගත් අත් මිල ගණන් අනුව අවම මිල යටතේ මිලදීගැනීම් සිදු කරනවාට වඩා එම කණුවල ගුණාත්මකභාවය තාක්ෂණ නිලධාරියෙකු ලවා පරීක්ෂා කර බලා ශක්තිමත් සහ මුදලට සරිලන ගුණාත්මකබවින් යුතු කණු මිලට ගැනීම කළ යුතු බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය. තවද, උස අඩි 6ක් වත් විය යුතු බවට ද තීරණය විය.

- **තීරණ අංක 12**

සභා ශාලාවේ සිවිලම කොටසක් අලුත්වැඩියා කර ගැනීම සඳහා අත් මිල ගණන් ලබා ගත් අතර ලියාපදිංචි සේවා සැපයුම්කරුවන් නොමැති වූ බැවින් මෙසේ ප්‍රාදේශීය අත්මිල ගණන් ලබා ගැනුණි.

| අනු අං | විස්තරය | සෙනවිරත්න බිල්ඩර්ස් | ලියන්දෙණිය බිල්ඩර්ස් |
|---|---|---|---|
| 01 | ගැලවී අැති සිවිලිම ස්කෲ ඇණ යොදා මෝල්ඩින් යොදා සකස් කිරීම | 8000.00 | 7700.00 |

ලබා ගත් මිල ගණන් අනුව අවශ්‍ය වන පරිදි සිවිලිම අලුත්වැඩියා කිරීමට හැකි සහ අවම මිල ගණන් යටතේ ලියන්දෙනිය බිල්ඩර්ස් ආයතනයට රු.7700.00 ට සිවිලිම අලුත්වැඩියා කිරීමට පැවරීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

**<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

01. ඩී.ජී. ගුණසේන මයා - ගරු සභාපති
02. අසේල අමරසේන මයා - ගරු උප සභාපති
03. ජයන්ත කීර්තිසිංහ මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. ශාන්ත නවරත්න මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. ඒ.එච්.ඒ.රත්නායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. හේමකුමාර නයනානන්ද මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. මංජුල දිසානායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. රන්ජන් රාජපක්ෂ මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
09. තංගවේලු කාමරාජන් මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. ඩිමෝෂි වෙලපලාගම මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි
11. කෝකිලා වරාහේන මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි

එස්.සුබසිංහ මිය - ලේකම්

ඩබ්.එන්.පොඩිමැණිකේ මිය - සංවර්ධන නිලධාරි

සකස් කළේ: ..……………........…………

පරීක්ෂා කළේ: ………………………….....

සභාපති / ලේකම්: ……………...................….